අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

2021

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
State Printing Corporation

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2021
වාර්ෂික වාර්තාව

වාර්ෂික වාර්තාව,
ගිණුම් ප්‍රකාශන
සහ
විගණකාධිපතිගේ වාර්තාව

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ 54 වෙනි වසර සඳහා
2021 ජනවාරි මස 01 වෙනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

දැක්ම

මුද්‍රණයේ විශිෂ්ටත්වය තුළින්
අපගේ පාරිභෝගිකයන්ගේ හා
පාර්ශවකරුවන්ගේ
චින්තනයේ සහ තේරීම තුළ
ප්‍රමුඛයා බවට
පත්වීම.

මෙහෙවර

උගත් සහ මනා කැපවීමක් සහිත
ශ්‍රම බලකායක් සමඟ අති නවීන තාක්ෂණය,
තත්ත්ව කළමනාකරණ,
පරිසරය හා බලශක්ති කළමනාකරණ පද්ධතීන් තුළින්
කාර්යක්ෂම, ඵලදායී සහ තිරසාර
මුද්‍රණ සංවර්ධනයක් උදෙසා
කැපවෙමු.

පානළුව,
පාදුක්ක.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වෙනි වගන්තියේ කොන්දේසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය ආවරණය කෙරෙන,

01. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව
02. ගණන් පරීක්ෂණයට භාජනය කරන ලද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය හා විස්තීරණ ආදායම් ප්‍රකාශය ඇතුළු මූල්‍ය ප්‍රකාශන
03. විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම

ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී

සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

සභාපතිතුමාගේ පණිවිඩය



රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව මේ දක්වා වූ වසර 55ක ඉතිහාසය තුළ වඩාත්ම අභියෝගාත්මක හා වම අභියෝගයන්ට සාර්ථකව මුහුණ දී ලත් ජයග්‍රහණයන් සමග 2021 වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට හැකිවීම මා ලද භාග්‍යයක් සේ සලකමි.

පසුගිය කාලය තුළ රටේ පැවති විනිමය අර්බුදය හමුවේ දිවයින පුරා සිටින පාසල් දරුවන්ගේ පෙළපොත් අවශ්‍යතාවය සපුරාලීම සඳහා වූ කඩදාසි ආනයනය කිරීමේ විශාල ගැටලුකාරී තත්ත්වයක් පැන නැඟී තිබූ මොහොතක, ඉන්දීය ණය යෝජනාක්‍රමය හරහා අවශ්‍ය කඩදාසි ලබාගෙන දරුවන්ගේ අවශ්‍යතාවය ඉහළ ගුණාත්මයෙන් යුතුව සම්පූර්ණ කිරීමට හැකිවීම මහත් භාග්‍යයක් කොට සලකමි. වමෙන්ම අපගේ ගණුදෙනුකරුවන්ගේ පරිණාමය වන අවශ්‍යතා සපුරාලීම සඳහා අපගේ නිෂ්පාදන ක්‍රියාවලියන් තාක්ෂණයන් හා සේවාවන් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට උත්සාහ ගනු ලබන මොහොතක ඉතා උසස් ප්‍රමිතියෙන් යුත් අභ්‍යාස පොත් සෘජු වෙළඳ නාමය යටතේ දරුවන් වෙත ලබාදීමට හැකියාව ලැබී ඇත. තවද සුරක්ෂා මුද්‍රණයෙන් හා වාණිජ මුද්‍රණයෙන් ආයතනයට ලැබෙන කීර්තිය සුළුපටු නොවන අතර වය ශ්‍රී ලංකාවේ මුද්‍රණ ක්ෂේත්‍රයේ ඉදිරියෙන්ම සිටීමට මහත් පිටිවහලක් වී ඇත.

වමෙන්ම සමාජ වගකීම් සහිත සංස්ථාවක් ලෙස, තිරසාර සංවර්ධනයේ වැදගත්කම සහ අපගේ පාරිසරික බලපෑම් අවම කරමින් අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් සංරක්ෂණය කිරීම සහ අපගේ කාබන් පියසටහන අවම කිරීම සඳහා මේ මොහොත වන විට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

අතීතයේ පැවති විවිධ හැලහැප්පීම් හා බාධක පරයමින් තරගකාරී වෙළඳපොළ තුළ හුදකලා වූ තැන් නිවැරදි කරමින් මුද්‍රණයේ දැවැන්ත පියවරයන් තැබීමට සිහින දකින අප වම සිහිනයන් යථාර්ථයක් කර ගැනීමට මග පෙන්වන විවිධ අංශවල සිටින විවිධ පාර්ශ්වකරුවන්ට සහ සේවා ලාභීන්ට මෙන්ම සංස්ථාවේ සියලුම නිලධාරීන් හා සේවකයින්ට මාගේ කෘතඥතා පූර්වක ගෞරව ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ඩී. එල්. ඒ. විජේනායක
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2021 අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති

ජනක රත්නකුමාර මහතා

අධ්‍යක්ෂ මණ්ඩලය

1. විජිත නන්දකුමාර මහතා
2. ඊ. ජී. ඒච්. එම්. රණසිංහ මහතා
   (2020. 02. 05 සිට 2021. 06. 28 දක්වා)
3. රුචිර වීරසේකර මහතා
   (2021. 06. 28 සිට 2022. 04. 21 දක්වා)
4. ඒච්. එල්. ඩබ්. ගාමිණී මහතා
5. ඩී. ඒච්. කණ්ඩම්බි මහතා
6. ඒච්. ටී. එල්. චාමිකර මහතා
7. යූ. ජී. එස්. රංගජීව මහතා

2021 විධායක නිලධාරී මණ්ඩලය

මුදල් කළමනාකරු (වැ.බ.)
එම්. ආර්. පී. ජයවර්ධන මහතා

සැපයුම් කළමනාකරු
ඊ. වී. කේ. කීර්තිරත්න මහතා

වැඩ කළමනාකරු
ටී. එම්. ආර්. එන්. තෙන්නකෝන් මහතා

නියෝජ්‍ය වැඩ කළමනාකරු
එස්. ඩී. කුමාරසිංහ මහතා

කළමනාකරු (ලිපි ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව)
එල්. ටී. ප්‍රේමසිරි මහතා

ගණකාධිකාරි
එම්. ආර්. පී. ජයවර්ධන මහතා

අභ්‍යන්තර විගණක
එම්. එස්. එස්. මොහොට්ටි මහතා

සහකාර කළමනාකරු වැඩ (ඇස්තමේන්තු)
කේ. ඩී. ටී. චන්ද්‍රසිරි මහතා

සහකාර කළමනාකරු වැඩ (සුරක්ෂා)
එම්. ඒ. කොතලාවල මහතා

සහකාර කළමනාකරු වැඩ (පොත් බැඳීම්)
පී. කේ. තිලක් මහින්ද මහතා

සහකාර කළමනාකරු (විකුණුම්)
එච්. ආර්. ගුණසේකර මහතා

සහකාර කළමනාකරු (තොරතුරු තාක්ෂණ)
ආර්. එම්. ඒ. පී. බී. රාජකරුණා මහතා

සහකාර කළමනාකරු
(පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)
එන්. වී. එන්. ආර්. ආශිංශනී මිය

සහකාර කළමනාකරු
(නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)
ඒ. එල්. ආර්. මධුකානි මහත්මිය

සහකාර කළමනාකරු (ප්‍රකාශන)
මධුරංග සී. නුවන්ප්‍රිය මහතා

සහකාර කළමනාකරු (සැපයුම්)
යූ. අනිල් ජයකාන්ත මහතා

ගණකාධිකාරි
ඩබ්. ඒ. ඒ. එස්. ජයසුන්දර මහතා

සහකාර කළමනාකරු වැඩ (නඩත්තු)
එන්. ජී. එල්. චන්දිමාල් මහතා

ගණකාධිකාරි
එන්. යූ. එස්. ද සිල්වා මහතා

2021

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1971 අංක 38 දරන මුද්‍රල් පනතේ 14 වන වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ ඇතුළත් සිය 53 වෙනි වාර්තාව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් මෙසේ ඉදිරිපත් කරයි.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09 ක් පවත්වන ලදී.

01. නිෂ්පාදනය

1.1 පාසල් පෙළ පොත්


1.1.1 පාසල් පෙළ පොත් මුද්‍රණය

පාසල් පෙළ පොත් මුද්‍රණය මූලික අරමුණ කර ගනිමින් පිහිටුවනු ලැබූ සංස්ථාව විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමගම වෙනත් නිෂ්පාදන අංශ කරා යොමුවී ඇත. ඒ සමගම පාසල් පොත් මුද්‍රණය සෘජුව සංස්ථාව වෙත පැවරීම වෙනුවට ටෙන්ඩර් මගින් තරගකාරීව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ඇණවුම් ලබා ගැනීමට සංස්ථාවට සිදුවිය. එහෙත් එම ක්‍රමය වෙනස් කරමින් 2021 වර්ෂයේදී ද ටෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව පෙළ පොත් මුද්‍රණය සංස්ථාවට පැවරීමට කැබිනට් අනුමැතිය ලැබිණි. ඒ අනුව 2021 වසරේ දී ද පාසල් පෙළ පොත් පිටපත් මිලියන 14.9 ක් මුද්‍රණය කර දෙමින් සංස්ථාවට රු. මිලියන 1186.9 ක ආදායමක් ලැබුණි.


සමාලෝචිත වර්ෂයේ මුද්‍රණය කළ පාසල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව හා ඉන් ලද ආදායම 2019 හා 2020 ට සාපේක්ෂව පහත දැක්වේ.

පාසල් මුද්‍රණ වැඩ	2019 ('000)	2020 ('000)	2021 ('000)
පිටපත් සංඛ්‍යාව	11,012	15,910	14,900
ආදායම - රු.	1,090,416	1,297,850	1,186,918

පාසල් පෙළ පොත්



පාසල් පෙළ පොත්



1.2 වෙනත් මුද්‍රණ සේවා


සමාලෝචිත වර්ෂය තුළදී ආරක්ෂිත මුද්‍රණ සේවා, ලොතරැයිපත්, සහ රාජ්‍ය ආයතන සඳහා මුද්‍රණ සේවා සපයන ලදී. එමෙන්ම විවිධ ආයතන සඳහා දිනපොත්, කැලැන්ඩර් යනාදිය මුද්‍රණය කරන ලදී. මීට අමතරව විවිධ ආයතනවල මුද්‍රණ කාර්යයන් ද ඉටු කරන ලදී. විශේෂ මුද්‍රණ සේවා කිහිපයක් පහත පරිදි වේ.

1.2.1 සුරක්ෂා මුද්‍රණ සේවා


ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා මහජන සම්පත ලොතරැයිය දැනට වසර 47ක පමණ කාලයක් මුද්‍රණය කරන ලදී. මීට අමතරව මෙගා පවර්, නීරෝගා, දරු දිරි සම්පත ලොතරැයිය ද මුද්‍රණය කරනු ලැබේ. ලොතරැයි මණ්ඩලයෙන් ලද සියලුම ඇණවුම් මුද්‍රණය කර දුන් අතර, 2021 වසරේදී මුද්‍රණය වූ ලොතරැයි ප්‍රමාණය මිලියන 510,285 කි. ඒ අනුව ආදායම රු. මිලියන 247,229 ක් වී ඇත. ලොතරැයි මුද්‍රණයේ ආදායම හා පිටපත් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

ලොතරැයි මුද්‍රණ වැඩ	2019 ('000)	2020 ('000)	2021 ('000)
පිටපත් සංඛ්‍යාව	524,474	534,727	510,285
ආදායම - රු.	293,440	299,447	247,229

සුරක්ෂා මුද්‍රණය



සුරක්ෂා මුද්‍රණය



1.2.2 වෙනත් මුද්‍රණ සේවා

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සඳහා මෙන්ම පෞද්ගලික අංශයේ ඇණවුම් ලබා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන ලදී. ඉටු කරන ලද විශේෂ මුද්‍රණ සේවා අතර පහත සඳහන් සේවා ප්‍රධාන තැනක් ගන්නා ලදි.

01. විවිධ ආයතනයන් සඳහා වූ වාර්ෂික වාර්තා
02. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා වූ විවිධ මුද්‍රණ වැඩ කටයුතු
03. රුහුණ /සබරගමු /වයඹ විශ්ව විද්‍යාල සහතික පත් හා සහතික පත් බහාලුම් කවර
04. ජාතික සත්වෝද්‍යානයට අයත් ප්‍රවේශ පත්‍ර හා අනෙකුත් විස්තර පත්‍රිකා
05. සිනමාශාලා ටිකට්පත්
06. භූ විද්‍යා දෙපාර්තමේන්තුවේ විවිධ මුද්‍රණ වැඩ
07. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අයත් මුද්‍රණ කටයුතු
08. සෞඛ්‍ය සේවා කාර්යාංශයේ කොවිඩ් මර්දනයට අදාළ පත්‍රිකා මුද්‍රණය කිරීම
09. වයඹ පළාත් පූර්ව ළමා විය සංවර්ධන ආයතනයේ තරුකැට සඟරාව


සමාලෝචිත වර්ෂයේදී විවිධ මුද්‍රණ වැඩ ඉටු කරමින් සංස්ථාව ලත් ආදායම රු. මිලියන 53 කි.

1.3 අභ්‍යාස පොත් සහ අනෙකුත් පොත් නිෂ්පාදනය

2021 වසරේ දී නිෂ්පාදනය පහත පරිදි වේ.

විස්තරය	නිෂ්පාදන ප්‍රමාණය	වටිනාකම (රුපියල්)
අභ්‍යාස පොත් (පිටු 80 පොත් වලින්)	මිලියන 3.715	මිලියන 106.111
සී. ආර්. පොත් (පිටු 80 සී.ආර්. පොත් වලින්)	මිලියන 0.768	මිලියන 47.694
වෙනත් ලිපිද්‍රව්‍ය නිෂ්පාදන (ඒකක වලින්)	මිලියන 0.111	මිලියන 10.535
එකතුව	මිලියන 4.595	මිලියන 164.341


අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් සමස්ත පිටපත් සංඛ්‍යාව



සමාලෝචිත වර්ෂයේ දී ලිපිද්‍රව්‍ය අංශයේ නිෂ්පාදනය 2019 හා 2020 වසරවලට සාපේක්ෂව පහත පරිදි වේ.

අභ්‍යාස පොත් හා අනෙකුත් පොත්	2019 ('000)	2020 ('000)	2021 ('000)
පොත් පිටපත් සංඛ්‍යාව	5,766	5,354	4,595
ආදායම් - රු.	187,035	172,026	164,341

අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් සමස්ත ආදායම




සංස්ථාවේ පැවති මූල්‍ය අර්බුදය නිසා ණයවර ලිපි විවෘත කිරීමට නොහැකි වීමෙන් අමුද්‍රව්‍ය හිඟවීම නිසාත් කොවිඩ් අර්බුදය නිසා රාජ්‍ය චක්‍රලේඛ වලට අනුව සේවකයින් සේවා චක්‍ර ක්‍රමයට ගෙන්වීමත් නිසා අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකි විය.

2021 වසරේ නිෂ්පාදන ඉලක්කය : මිලියන 10,9
(වටිනාකම රු. මිලියන 340)

02. අලෙවි හා විකුණුම්

වර්ෂය	2019 රු.	2020 රු.	2021 රු.
සමස්ත ආදායම (බදු ඇතුළත්)	153,082,388.79	149,717,779.84	126,407,838.00

සමස්ත අලෙවිය



2021 වර්ෂයේදී සමස්ත අලෙවි ආදායම විශාල වශයෙන් අඩු වීමක් සිදු වී ඇත.

2020 වසරේ ආදායම අඩුවීමේ ප්‍රතිශතය 2.19% ප්‍රමාණය 2021 වර්ෂයේදී 15.5% ක් දක්වා ඉහළ ගොස් ඇත. ආදායම් අඩුවීමට ප්‍රධාන හේතුව ලෙස 2021 වර්ෂයේ අභ්‍යාස පොත් නිෂ්පාදනය සඳහා රට තුළ පැවති කොවිඩ් තත්ත්වය හමුවේ සිදු වූ සේවා චක්‍ර ක්‍රමය හා මූල්‍ය අර්බුදය හේතුවෙන් ප්‍රමාණවත් තරම් කඩදාසි ගෙන්වා ගැනීමට නොහැකි වීම තුළින් නිෂ්පාදනය පෙර වර්ෂවලට සාපේක්ෂව පහත වැටිණි.

මීට අතිරේකව බාහිර ආයතන මගින් මිලට ගෙන නැවත අලෙවි කිරීමට යොදාගන්නා ලිපිද්‍රව්‍ය අයිතමයන් 2021 වර්ෂය තුළ අපේක්ෂිත පරිදි සපයා ගැනීමට නොහැකි වීම අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. එයට හේතුව වූයේ කාරක ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතාවයන්ය.

ප්‍රකාශන සේවා

2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී ප්‍රකාශන ආදායම සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කරයි. ප්‍රකාශන අංශය සතු තොග සංගණනයක් කර එය අලෙවි කිරීමේ වැඩ සටහනක් දියත් කිරීම 2021 වර්ෂයේදී සිදු කරන ලදී.

2020 ප්‍රකාශිත නව කෘති ගණන	02
2019 ලද ප්‍රකාශන ආදායම	මිලියන 2.3
2020 ලද ප්‍රකාශන ආදායම	මිලියන 5.8
2021 ලද ප්‍රකාශන ආදායම	මිලියන 0.64

03. ස්ථාවර වත්කම්

2021 වර්ෂය අවසානයේදී සංස්ථාව සතු ස්ථාවර වත්කම්වල මුළු පිරිවැය රු. 1,323,071/- ක් විය. එහි ශුද්ධ වටිනාකම රු. 1,035,427/- කි. මෙම තත්ත්වය මීට පෙර එනම් 2020 වසර හා සැසඳීමේදී පිළිවෙළින් රු. 1,176,497,069 ක් හා රු. 945,054,250 /- ක් වශයෙන් විය.

ස්ථාවර වත්කම්	2019 රු.('000)	2020 රු.('000)	2021 රු.('000)
ආරම්භක වටිනාකම (පිරිවැයට)	1,168,709	1,176,497	1,176,497
වර්ෂ අවසාන ශුද්ධ වටිනාකම	991,125	945,054	1,035,427

04. බදු බැඳියාව


සංස්ථාව තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ආදායම් බදු හා ලාභාංශ බදු ලෙස කිසියම් හෝ මුදලක් සංස්ථාවේ 2021 වසරේ අවසාන ගිණුම් අනුව ප්‍රතිපාදනය කොට නොමැත.

බදු බැඳියාව	2019 රු. ('000)	2020 රු. ('000)	2021 රු. ('000)
ආදායම් බදු	-	-	-
ලාභාංශ බදු	-	-	-
එකතුව	-	-	-

05. ලාභය


2021 වසර තුළදී සංස්ථාව රු. 208,096/- ක බදු පෙර අලාභයක් උපයා ඇති අතර, 2020 වසරේදී රු. 43,734,288/- ක අලාභයක් විය.

ලාභදායිතාව	2019 රු. ('000)	2020 රු. ('000)	2021 රු. ('000)
බදු පූර්ව ලාභය	(169,428)	(22,914)	(208,096)
බදු ප්‍රතිපාදනයෙන් පසු	(169,428)	(22,914)	(208,096)



06. ප්‍රසාද දීමනා

2016 වසරේ සිට සංස්ථාව අඛණ්ඩව අලාභදායීත්වයක් ලැබූ හෙයින් 2021 වසර සඳහා ප්‍රසාද දීමනා මුදලක් සංස්ථා සේවකයින්ට නොගෙවූ අතර ඒ වෙනුවට 2022 වසරේදී සේවක ඉල්ලීම් පදනම් කරගනිමින් සේවකයින්ගේ අභිප්‍රේරණය ඇති කිරීම සඳහා සේවක කාර්යසාධනය ඉහළ නැංවීමේ අරමුනින් විශේෂ දිරි දීමනාවක් ගෙවීමට කටයුතු කර ඇත.



ප්‍රසාද දීමනා	2019 රු. ('000)	2020 රු. ('000)	2021 රු. ('000)
	22,097	-	-

07. සුභ සාධනය

පහත සඳහන් සුභ සාධන සේවා හා පහසුකම් පසුගිය වර්ෂයේ ගෙවූ ආකාරයට මෙම වසර තුළදී ද පවත්වාගෙන යන ලදී. මේ වෙනුවෙන් සංස්ථාව වැය කළ මුළු මුදල රු. මිලියන 34 ක් විය. 2021 වර්ෂයේ මූල්‍ය පසුබෑම හේතුවෙන් සේවක සුභසාධනය කැපී පෙනෙන ලෙස අවම වී ඇත.

	සුභ සාධනය	2019 රු.('000)	2020 රු.('000)	2021 රු.('000)
01.	සේවක ප්‍රවාහන පහසුකම්	8,503	6,962	8,146
02.	සේවක දිරි දීමනා ගෙවීම්	4,784	4,815	-
03.	වෛද්‍යාධාර ප්‍රතිලාභ ගෙවීම	9,431	8,158	9,088
04.	සේවක විවිධ සුභ සාධනය	21,171	18,936	17,134
05.	කම්කරු වන්දි ආරක්ෂණය	-	-	-
06.	සියලුම සේවකයින් සඳහා ලිපිද්‍රව්‍ය තෑගි වවුචරයක් ප්‍රදානය කිරීම	1,378	1,447	-
07.	සේවක ප්‍රසාද දීමනා	22,097	-	-
08.	සේවක නිවාස ණය ප්‍රතිපූරණය	2,087	1,773	-
09.	සේවක ඉතිරි නිවාඩු සඳහා ගෙවීම	13,210	-	-
10.	විශේෂ දිරි දීමනා	15,675	-	-
	එකතුව	**98,336**	**42,091**	**34,368**

08. සේවක මණ්ඩලය

2021.12.31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 550 කි.

සේවක සංඛ්‍යාව	2021
කාර්යාලය	135
ප්‍රධාන මුද්‍රණාලය	297
ලිපිද්‍රව්‍ය කම්හල	47
ආරක්ෂක අංශය	35
අලෙවිසැල්	36
මුළු සේවක සංඛ්‍යාව	**550**

2021 වර්ෂය තුළ දී සේවයට බඳවාගෙන ඇති නිලධාරීන්

2021 වර්ෂය තුළදී සංස්ථාවට නිලධාරි මට්ටමේ සේවක මහත්ම මහත්මීන් කිසිවකු බඳවාගෙන නොමැත.

2021 වර්ෂය තුළ දී සේවයෙන් ඉවත් වූ / විශ්‍රාම ගිය නිලධාරීන්

	නම/තනතුර	ඉවත් වූ දිනය
1.	කේ. ඩී. ටී. චන්ද්‍රසිරි මහතා - සහකාර වැඩ කළමනාකරු (ඇස්තමේන්තු)	2021.12.06

සමාප්තිය

කොවිඩ් වසංගත තත්ත්වය තුළ සංචරණ සීමාවන් පැනවූ කාලසීමාවලදී ද සෞඛ්‍යාරක්ෂිතව සංස්ථාවේ පෙළ පොත් නිෂ්පාදනය, අභ්‍යාස පොත් නිෂ්පාදනය සහ ලොතරැයි මුද්‍රණය ආදී ප්‍රධාන මුද්‍රණ කාර්යයන් කිසිදු බිඳ වැටීමකින් තොරව කරගෙන යාම සඳහා කළමනාකාරීත්වයට හා සේවක මණ්ඩලයට විශේෂයෙන් ස්තුතිය පළ කරන අතර එමෙන්ම සාර්ථක වැඩ පිළිවෙළක් සඳහා සෑම විටම මග පෙන්වමින් සහය ලබාදුන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාටත් එම වැඩ පිළිවෙළට නිරතුරුව සහයෝගය ලබා දුන් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ.

ඉදිරි වර්ෂය තුළදී ද එවැනිම සහයෝගයක් හා ප්‍රතිචාරයක් සංස්ථාවේ සියලු සේවකයින්ගෙන් පාලනාධිකාරිය බලාපොරොත්තු වන්නේය.

සභාපති

2021

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය

	සටහන්	2021 රු.	2020 නැවත සකස්කළ රු.	2020 රු.
ආදායම	7	1,633,347,511	1,821,360,938	1,843,090,170
විකුණුම් පිරිවැය	8	(1,473,509,796)	(1,492,137,428)	(1,494,208,078)
දළ ලාභය		159,837,715	329,223,510	348,882,092
වෙනත් මෙහෙයුම් ආදායම	9	25,623,234	20,491,155	20,240,846
බෙදාහැරීමේ වියදම්	10	(35,340,658)	(21,775,010)	(21,775,010)
පරිපාලන වියදම්	11	(186,000,274)	(170,176,441)	(170,176,441)
වෙනත් මෙහෙයුම් සඳහා වියදම්	12	(83,450,427)	(83,116,684)	(35,876,369)
මෙහෙයුම් ලාභය		(119,330,410)	74,646,529	141,295,117
මූල්‍ය ආදායම	13.1	1,979,257	1,977,815	1,977,815
වෙනත් ආදායම් - මහා භාණ්ඩාගාර ප්‍රධානය (2021 හානිකරණය කපා හැරීම්)		7,088,008	-	-
මූල්‍ය වියදම්	13.2	(97,833,511)	(120,358,632)	(120,358,632)
වර්ෂයේ බදුපෙර ඌනතාවය/අතිරික්තය		(208,096,656)	(43,734,288)	22,914,300
ආදායම් බදු	14	-	-	
වර්ෂයේ බදුපසු ඌනතාවය/අතිරික්තය		(208,096,656)	(43,734,288)	22,914,300
වෙනත් විස්තීරණ ආදායම්				
ඉඩම් විකිණීම ලාභය/පාඩුව		(73,861,249)	-	-
වර්ෂය සඳහා බදු අතිරික්තය/ඌනතාවය		(281,957,906)	(43,734,288)	22,914,300

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

	සටහන	2021	2020 නැවත සකස්කළ	2020
		රු.	රු.	රු.
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	15	1,035,427,927	945,054,250	945,054,250
ස්ථිර තැන්පතු		25,000,000	-	--
විලම්බිත බදු වගකීම්	21	-	-	-
		1,060,427,927	**945,054,250**	**945,054,250**
ජංගම වත්කම්				
තොගය	16	327,871,465	308,177,000	306,106,350
වෙළඳ ලැබිය යුතු ශේෂය	17	678,526,544	591,450,459	613,179,690
වෙනත් ලැබිය යුතු ශේෂයන්	18	25,151,782	28,826,335	28,826,335
පූර්ව ගෙවීම්		237,580	255,645	255,645
මුදල් හා මුදල්වලට සමාන දෑ	19	35,004,991	36,135,080	36,135,080
මුළු ජංගම වත්කම්		1,066,792,361	964,844,519	984,503,100
මුළු වත්කම්		**2,127,220,289**	**1,909,898,769**	**1,929,557,350**
ස්කන්ධය හා බැරකම්				
ප්‍රාග්ධන නිකුතුව		15,000,000	15,000,000	15,000,000
රඳවා ගත් ඉපයීම්		(931,669,314)	(649,566,244)	(582,917,657)
එකතු කළා: ප්‍රත්‍යාගණන ලාභ		808,011,707	808,011,707	808,011,707
මුළු ස්කන්ධය		**(108,657,608)**	**173,445,463**	**240,094,050**
ජංගම නොවන බැරකම්				
බැංකු ණය - දිගු කාලීන	20	55,497,200	92,917,055	92,917,055
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්		163,289,487	174,543,043	174,793,353
මහා භාණ්ඩාගාර ප්‍රධානය - යන්ත්‍ර සඳහා	25	210,294,414	-	-
එකතුව - ජංගම නොවන බැරකම්		**429,081,101**	**267,460,098**	**267,710,408**
ජංගම බැරකම්				
වෙළඳ ගෙවිය යුතු ශේෂයන්	22	666,418,516	328,246,396	328,246,396
වෙනත් ගෙවිය යුතු ශේෂයන්	23	79,301,155	87,044,726	39,804,411
කෙටි කාලීන ණය - (ණය පොළී සහිත)	24	1,024,101,430	985,463,449	985,463,449
ගෙවිය යුතු ණය ශේෂය (පොළී රහිතව මිලදී ගැනීම්)		-	24,326,804	24,326,804
බැංකු අයිරා		36,975,695	43,911,832	43,911,832
මුළු ජංගම බැරකම්		**1,806,796,796**	**1,468,993,207**	**1,421,752,892**
මුළු ස්කන්ධය හා බැරකම්		**2,127,220,289**	**1,909,898,769**	**1,929,557,350**

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කරමු.

එම්. ආර්. පී. ජයවර්ධන
මුදල් කළමණාකරු (වැ.බ.)

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ. පිටු අංක 20, 21 සහ 22 හි ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 15, 16 මෙන්ම 23 සිට 28 දක්වා ඇතුළත් අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත්ම අංග වේ.

.....
ජේ. එම්. ඌ. බී. ජයසේකර
සභාපති/අධ්‍යක්ෂ

.....
ආර්. එල්. වීරසේකර
අධ්‍යක්ෂ

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රාග්ධන නිකුතුව රු.	ප්‍රාග්ධන සංචිතය රු.	පොදු සංචිතය රු.	සංවර්ධන සංචිතය රු.	ප්‍රත්‍යාගණන ලාභය රු.	රඳවාගත් ඉපැයීම් රු.	එකතුව රු.
2020 ගිණුම්							
2020. 01. 01 වැනි දිනට ශේෂය	15,000,000	102,490	1,000,000	13,901,142	808,011,707	(648,559,111)	189,456,228
පෙර වර්ෂයේ ගැළපීම්						42,727,155	42,727,155
ප්‍රවර්තන වර්ෂයේ ගැළපීම්		(102,490)	(1,000,000)	(13,901,142)			(15,003,632)
ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු)						22,914,300	22,914,300
2020. 12. 31 දිනට ශේෂය	**15,000,000**	**-**	**-**	**-**	**808,011,707**	**(582,917,657)**	**240,094,051**
2020 ගිණුම් - නැවත සකස්කළ							
2020. 01. 01 වැනි දිනට ශේෂය	15,000,000	102,490	1,000,000	13,901,142	808,011,707	(648,559,111)	189,456,228
පෙර වර්ෂයේ ගැළපීම්						42,727,155	42,727,155
ප්‍රවර්තන වර්ෂයේ ගැළපීම්		(102,490)	(1,000,000)	(13,901,142)			(15,003,632)
ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු)						(43,734,288)	(43,734,288)
2020. 12. 31 දිනට ශේෂය	**15,000,000**	**-**	**-**	**-**	**808,011,707**	**(649,566,244)**	**173,445,463**
2021 ගිණුම්							
2021. 01. 01 දිනට ශේෂය	15,000,000	-	-	-	808,011,707	(649,566,244)	173,445,462
පෙර වර්ෂයේ ගැළපීම්						(145,164)	(145,164)
ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු)						(281,957,906)	(281,957,906)
2021. 12. 31 දිනට ශේෂය	**15,000,000**	**-**	**-**	**-**	**808,011,707**	**(931,669,314)**	**(108,657,608)**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021 රු.	2020 නැවත සකස්කළ රු.	2020 රු.
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය			
බදු පෙර ලාභය	(208,096,656)	(43,734,288)	22,914,300
ගැළපීම්:			
ස්ථාවර වත්කම් ක්ෂය	56,201,209	53,859,274	53,859,274
වෙනත් ආදායම් - 2021 භාණ්ඩාගාර ප්‍රදානයන්	(7,088,008)		
ජංගම නොවන වත්කම් විකුණුම් ලාභය	-	-	
පෙර වර්ෂයේ ගැළපීම් (Effected to Cash Flow)	(145,164)	44,828,920	44,828,920
මූල්‍ය වියදම්	97,833,511	120,358,632	120,358,632
ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළිය	(625,000)	-	-
පාරිතෝෂික සඳහා වසර තුළ වෙන්කළ ප්‍රතිපාදන	16,366,766	(250,309)	-
අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු සඳහා වෙන් කිරීම	9,343,150	5,762,226	5,762,226
අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු වෙන් කිරීම් සඳහා ගෙවීම්	(5,762,226)	(9,028,466)	(9,028,466)
බොල්ණය සඳහා වෙන් කිරීම	29,527,127	1,984,063	1,984,063
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**(12,445,292)**	**173,780,053**	**240,678,949**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම			
තොගය (වැඩිවීම) / අඩුවීම	(19,694,465)	(33,043,322)	(30,972,672)
(වැඩිවීම්)/වෙළඳ ලැබීම් අඩුවීම	(120,184,136)	(196,900,171)	(218,629,402)
(වැඩිවීම්)/වෙනත් ලැබීම්වල හා පෙර ගෙවීම්	4,317,618	247,484	247,484
ජංගම බැරකම්වල වැඩි/(අඩුවීම)	306,101,745	80,421,750	33,181,435
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය	**158,095,470**	**24,505,794**	**24,505,795**
ගෙවූ බදු	-	-	-
සේවක විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම	(27,620,322)	(16,913,658)	(16,913,658)
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ ශුද්ධ මුදල් ප්‍රවාහය	**130,475,148**	**7,592,136**	**7,592,137**
ආයෝජන කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය			
ස්ථාවර වත්කම් අලෙවිය තුලින් ජනනය වූ	33,138,751	-	-
ස්ථාවර වත්කම් මිලදී ගැනීම් තුලින් ජනනය වූ	(36,192,464)	(7,788,303)	(7,788,303)
ස්ථිර තැන්පතු	(25,000,000)	-	-
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ගලාඒම	**(28,053,714)**	**(7,788,303)**	**(7,788,303)**
මූල්‍ය කටයුතුවලින් මුදල් ගලා ඒම			
ණය ලබා ගැනීම/ගෙවීම් තුලින් (ශුද්ධ ණය)	1,218,126	101,020,768	101,020,768
පොළී ගෙවීම්	(97,833,511)	(120,358,632)	(120,358,632)
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ගලා ඒම	**(96,615,386)**	**(19,337,864)**	**(19,337,864)**
ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) මුදල් හා මුදල්වලට සමාන දෑ	**5,806,049**	**(19,534,031)**	**(19,534,030)**
කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ	**(7,776,752)**	**11,757,279**	**11,757,279**
කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ (සටහන 19)	**(1,970,703)**	**(7,776,752)**	**(7,776,751)**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
2021 දෙසැම්බර් 31 වැනිදා වන විට

1. සංස්ථාව පිළිබඳ තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

1968 අංක 24 දරන පාර්ලිමේන්තු පනතට අනුව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 වසරේදී ස්ථාපනය කෙරිණි. ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය එහි කළමනාකාරීත්වය භාරව ක්‍රියා කරයි.
පාදුක්ක, පානඵව ප්‍රදේශයේ මෙය පිහිටා තිබේ.

1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ පාසල් පෙළ පොත් මුද්‍රණය, අභ්‍යාස පොත් නිෂ්පාදනය හා වෙනත් මුද්‍රණ කාර්යයන් සිදු කිරීමයි.

2. ගිණුම් ප්‍රමිතීන් හා පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ පුළුල් ප්‍රකාශනය, අරමුදල් හා මුදල් ගලා ඒමේ වෙනස්කම් සහ ප්‍රතිපත්ති මෙන්ම සටහන් සකසා ඇත්තේ LKAS සහ SLFRS යන ගිණුම්කරණ ප්‍රමිතීන් හා 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුවය.

2.1 අනුකූලතා ප්‍රකාශය

උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනය සකසා තිබේ.
ශ්‍රී ලංකා රුපියල්වලින් එය ඉදිරිපත් කර ඇත.

2.2 ඇගයුම් පදනම

පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබෙන්නේ ඓතිහාසික පිරිවැය පදනම් කර ගෙනය.

* විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් පොලී ආදායම
* ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්

2.3 අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව පවත්වා ගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් සිදු කොට අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත් එය ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා නොකරයි.

2.4 භාවිතාවන ව්‍යවහාර මුදල්

අවසාන ගිණුම් ඉදිරිපත් කර ඇත්තේ සංස්ථාවේ ව්‍යවහාර මුදල් වූ ශ්‍රී ලංකා රුපියල්වලිනි.
සියලුම මූල්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ රුපියල්වලින් වන අතර ආසන්න රුපියලේ අගයට වටිනාකම් දක්වා ඇත.

2.5 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් කලින් අවුරුදුවල අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තීන් නොවෙනස්ව ඒ ආකාරයෙන් අනුගමනය කර ඇත. අවශ්‍ය අවස්ථාවල කලින් අවුරුදුවල වටිනාකම් හා සඳහන් කිරීම් නැවත සකසා ඉදිරිපත් කිරීම් කර ඇත. සංස්ථාව විසින් ඉකුත් වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගළපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්වය නැවත ප්‍රකාශ කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සියලුම කාලපරිච්ඡේදයන් සඳහා ඒකාකාරී ලෙස නොකඩවා සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත.

3.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ සඳහන් කර ඇත්තේ එකතු ක්ෂයවීම් අඩු කරන ලද ශුද්ධ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම වේ.

පහත සඳහන් දිනවල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වත්කම් තක්සේරු කරන ලදී.

ඉඩම් හා ගොඩනැගිලි	-	02. 01. 2017 සිට 06. 01. 2017 දක්වා
කාර්යාලයීය උපකරණ ලී බඩු හා සවිකිරීම් පරිගණක උපාංග	-	02. 01. 2017 සිට 30. 01. 2017 දක්වා
යන්ත්‍ර හා පිරියත	-	16. 01. 2017 සිට 30. 01. 2017 දක්වා
මෝටර් රථවාහන	-	13. 01. 2016 සිට 14. 01. 2016 දක්වා

වත්කම් ප්‍රත්‍යාගණනයේ වෙනස හෝ ලාභය විස්තීරණ ආදායම තුළ දක්වා ඇති අතර හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුළ ප්‍රත්‍යාගණන සංචිතය නමින් ප්‍රත්‍යාගණන ලාභය දක්වා ඇත.
වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසු කාර්යාලීය උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් එකම පංතියක් ලෙසත් උපකරණ මෙවලම් සහ අත් කරත්ත තවත් පංතියක් ලෙසත් වර්ගීකරණය කර ඉදිරිපත් කර ඇත.

3.1.1 ක්ෂයවීම්

දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීවකාලය පිළිබඳ තක්සේරුවකින් පසු සරල මාර්ග ක්‍රමයට ක්ෂය වීම් ගණනය කරනු ලැබේ.

තක්සේරු කරන ලද වත්මන් හා සංසන්දනාත්මක ඵලදායී ජීවකාලය පහත පරිදි වේ.

ගොඩනැගිලි	වසර 40 යි
පිරියත හා යන්ත්‍රෝපකරණ	වසර 13.33 යි
මෝටර් හා වෙනත් වාහන	වසර 04 යි
කාර්යාලයීය උපකරණ හා ලී බඩු	වසර 10 යි
පරිගණක හා උපාංග	වසර 03 යි

3.2 තොගය

තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන අගයන්ගෙන් අවම අගයට ගණනය කර ඇත.

3.3 බදුකරණය

3.3.1 ආදායම් බදු

අදාළ වර්ෂයේ සහ පෙර වර්ෂවලට අදාළ ආදායම් බදු බැරකම් හෝ වත්කම් දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවීමට හෝ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ආදායම් බදු ගණනය කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇති දිනට වලංගු බදු ප්‍රතිශතයන් සහ එදිනට නීතිරීතිවලට අනුව කටයුතු කරනු ලැබේ. ආදායම් බදු සඳහා වෙන් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව ඇති ආදායම් සහ වැය ප්‍රභවයන්ට අනුව 2006 වර්ෂයේ දේශීය ආදායම් පනතේ 10 වන ඡේදයට අනුව සහ ඉන් පසුව සිදුකරන ලද සංශෝධනවලට යටත්ව කටයුතු කරනු ඇත.

3.4 මුදල් හා මුදල්වලට සමාන දෑ

අත ඇති මුදල්, මාර්ගස්ථ මුදල් සහ බැංකුවේ ඇති මුදල්, මුදල් හා මුදල්වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.
අරමුදල් ප්‍රධාන ප්‍රකාශනයේදී බැංකු අයිරාව සහ බැංකු ශේෂයට වැඩියෙන් ලබාගත් මුදල් ද මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.

මුදල් හා මුදල්වලට සමාන දෑ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සහ අනෙකුත් ගනුදෙනු සඳහා අධික ද්‍රවශීලතාවයක් ඇති ලෙස සැලකේ.

4. මූල්‍ය උපාංග - මූලික හඳුනාගැනීම් හා ඉදිරි පියවර

4.1 මූල්‍ය වත්කම්

4.1.1 වෙළඳ ණය ගැතියෝ

වෙළඳ ණය ගැතියන් සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කර ඇත.

4.2 මූල්‍ය බැඳුම්කර

4.2.1 දේපළ උකස් කිරීම

සංස්ථාවේ සියළු බැංකු පහසුකම් එනම් බැංකු අයිරාව, කෙටිකාලීන ණය, දිගුකාලීන ණය, ණයවර ලිපි හා කාර්ය සාධන බැංකු ඇපකර ලබාගැනීම සඳහා මහජන බැංකුව වෙත අංක MB 979/3063/3243/1147/422/5789 මගින් සංස්ථාවේ දේපල පිරියත හා උපකරණ උකස් කර ඇත.

මීට අමතරව රාජ්‍ය භාණ්ඩාගාර ඇපකරයක් මගින් 2018/09/07 දින අංක TO/REV/TG/522 යටතේ ද පහත ව්‍යාපෘති සඳහන් කරමින් මහජන බැංකු ණය පහසුකම් ලබාගෙන ඇත.

ව්‍යාපෘතියේ නම	සුරක්ෂිත මුදල (රු.)	කල් ඉකුත්වන දිනය
බැංකු අයිරා, ණයවර ලිපි හා බැඳුම්කර පහසුකම් සඳහා	මිලියන 1,165	2022. 09. 05
අළුත්වැඩියා සහ ක්‍රියාකාරකම් වර්ධනයට මූල්‍ය වෙන්කිරීම සඳහා	මිලියන 185	2023. 09. 15

4.2.2 අසම්භාව්‍ය බැරකම් හා ප්‍රාග්ධන බැඳීම්

(අ) සියළු ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය බැරකම් සලකා බලා ඇති අතර මෙම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපුම් හා අනාවරණයක් සිදු කර ඇත.

(ආ) හිටපු අලෙවි කළමනාකරු විසින් අංක FR248/19 යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති මූලික අයිතිවාසිකම් නඩුව හා LT 33/1556/2020 අංක යටතේ ඔහු විසින්ම පවරා ඇති කම්කරු විනිශ්චය සහා නඩුව

(ඇ) රු. මිලියන 350ක් අයකර ගැනීම සඳහා බේරුම්කරණ ක්‍රියාවලිය වෙත යොමුවන බවට දන්වමින් කේසර ලංකා ආයතනය විසින් නීතිඥයකු මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් යොමු කර ඇත.

(ඈ) අංජු පෙරේරාට එරෙහිව සංස්ථාව විසින් DMR /5233/19 යටතේ පවරා ඇති නඩුව

(ඉ) 2021. 12. 31 දින දක්වා විවෘත කරන ලද ණයවර ලිපියේ වටිනාකම රු. 68,077,592/- වන අතර බැංකු ඇපකරයේ වටිනාකම රු. 13,737,600/-

(ඊ) 2021 වසර සඳහා පෙළපොත් ඇණවුම රු. මිලියන 1030කි. අමුද්‍රව්‍ය මිල ඉහල යාම හේතුවෙන් මිලෙහි වෙනසට අදාලව ඉල්ලීමක් කර ඇති අතර ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. කැබිනට් අනුමැතිය ලැබීමෙන් පසු මිල සංශෝධනය 1233 දක්වා වේ. එම මිල සංශෝධනයට අනුව ඉන්වොයිස් නිකුත් කරනු ලැබේ.

4.3.1 සංචිත

මූලික ප්‍රාග්ධනය සඳහා මහා භාණ්ඩාගාරයද දායක වී ඇත.

4.3.2 ප්‍රත්‍යාගණන සංචිතය

මෙම සංචිතයට 2016 වසරේදී මෝටර් රථවාහන නැවත තක්සේරු කිරීමෙන් උපදවන ලද ලාභය හා පහත දැක්වෙන පරිදි දේපළ උපකරණ හා පිරියතවල නැවත ප්‍රත්‍යාගණනය කිරීමෙන් ජනිත වූ ලාභය ද ඇතුලත් වේ.

	2016 (Rs.)	2017/18 (Rs.)
මෝටර් හා වෙනත් වාහන	36,015,363	
දේපළ		377,290,608
ගොඩනැගිලි		158,049,568
පිරියත හා යන්ත්‍රෝපකරණ		246,979,194
කාර්යාලයීය උපකරණ සහ ලීබඩු		(8,785,874)
පරිගණක හා උපාංග		(1,537,152)
	36,015,363	**771,996,344**

5. විශ්‍රාම පාරිතෝෂිත වගකීම්

5.1 විශ්‍රාම පාරිතෝෂිකය

සංස්ථාව විසින් විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා 1083 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව සංස්ථාව වගකීමට බැඳේ.

වාර්තාකරනු ලබන දිනට ප්‍රතිලාභ අයදුම්පත්‍රයේ වාර්තාවන වටිනාකම ප්‍රක්ෂේපිත ඒකක ක්‍රමය අනුව මූල්‍ය ප්‍රකාශන තුල වගකීම ලෙස හඳුනාගෙන ඇත. හඳුනාගන්නා ලාභය හෝ පාඩුව වෙනත් ආදායම් තුල විස්තීරන ආදයම් ප්‍රකාශයේ හඳුනා ගනී.

5.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ නීතිරීතිවලට අනුව සංස්ථාව (සේවායෝජක) විසින් සේවාදායකයා වෙත අදාළ අරමුදල් සඳහා බැර කිරීමට බැඳී සිටී. සංස්ථාව විසින් 12% ක් සහ 3%ක් සේවාදායකයාගේ දළ වැටුපට අනුව සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා භාරකාර අරමුදලට පිළිවෙළින් දායකත්වයක් ලබාදෙනු ලැබේ.

6. ආදායම් හා වියදම්

6.1 ආදායම් හඳුනාගැනීම

උපචිත පදනම මත සියලු ආදායම් හඳුනා ගැනේ.

පොලී ආදායම

සංස්ථා සේවකයන්ට ලබා දෙන ණය සඳහා 10% ක පොලියක් අය කරනු ලැබේ.

6.2 වියදම් හඳුනාගැනීම

අයහාර වියදම්

සංස්ථාවේ පැවැත්මට හා දේපළ හා උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමට දරන ලද සියළු වියදම් වර්ෂය තුළ ආදායමින් අයකර ඇත.

ප්‍රාග්ධන වියදම්

සංස්ථාවේ දේපළ හා උපකරණවල ඉපයීමේ ධාරිතාව වර්ධනය කරගැනීම හා ඉදිරියට ගෙනයාම සඳහා, දේපළ අත්පත් කරගැනීම සඳහා දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද සියළු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

6.3 ණයට ගැනුම් පිරිවැය

ණයට ගැනුම් පිරිවැය ඒවා සිදුවූ කාලය තුළ වියදම් ලෙස හඳුනාගැනෙන අතර යන්ත්‍ර හා පිරියත ඒවා ක්‍රියාකාරීත්වයට පත්වන තෙක් දරණ ලද ඊට අදාළ පොලී වියදම ප්‍රාග්ධනගත කර ඇත.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

	2021 රු.	2020 නැවත සකස්කළ රු.	2020 රු.
07. ආදායම්			
ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් ලද ආදායම	126,407,838	122,003,076	122,003,076
ප්‍රධාන මුද්‍රණාලයෙන් ලද ආදායම			
පෙළ පොත්	1,186,918,385	1,369,812,655	1,369,812,655
ජොබ් වැඩ (වාණිජ මුද්‍රණ කටයුතු)	53,795,367	43,832,169	65,561,401
ජා.ලොම. ලොතරැයිපත්	247,229,602	266,593,026	266,593,026
ප්‍රකාශන	640,689	410,186	410,186
වෙනත් අලෙවි කටයුතුවලින් ලද ආදායම	18,355,631	18,709,825	18,709,825
	1,633,347,511	**1,821,360,938**	**1,843,090,170**
08. විකුණුම් පිරිවැය			
ප්‍රධාන මුද්‍රණාලය			
පරිභෝජනය කළ අමුද්‍රව්‍ය	896,611,944	764,884,230	764,884,230
සෘජු ශ්‍රමය	228,434,686	220,626,316	220,626,316
සෘජු කර්මාන්තශාලා වියදම්	49,942,451	51,401,247	51,401,247
වක්‍ර කර්මාන්තශාලා වියදම්	123,025,642	159,206,936	159,206,936
අනෙකුත් වියදම් / තොග ගැලපීම්	21,210,449	113,588,845	115,659,495
ප්‍රමාද ගෙවීම් තත්ත්ව හානි හා දඩ (අ. ප්‍ර. දෙ.)	410,261	29,789,127	29,789,127
ප්‍රමාද ගෙවීම් හා දඩ (ජා.ලොම.)	3,177,350	11,205,760	11,205,760
අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු සඳහා වෙන්කිරීම්	9,343,150	5,762,226	5,762,226
	1,332,155,933	**1,356,464,687**	**1,358,535,337**
ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාව			
පරිභෝජනය කළ ද්‍රව්‍ය	108,197,125	109,757,992	109,757,992
සෘජු ශ්‍රමය	33,378,635	33,562,154	33,562,154
සෘජු කර්මාන්තශාලා වියදම්	3,080,576	3,012,310	3,012,310
වක්‍ර කර්මාන්තශාලා වියදම්	13,212,450	15,490,986	15,490,986
අනෙකුත් වියදම් / තොග ගැළපීම්	(35,026,800)	(43,996,230)	(43,996,230)
	122,841,986	**117,827,212**	**117,827,212**
ප්‍රකාශන අංශයේ පිරිවැය	2,541,885	3,007,535	3,007,535
අනෙකුත් අලෙවි අංශවල පිරිවැය	15,969,992	14,837,994	14,837,994
මුළු විකුණුම් පිරිවැය	**1,473,509,796**	**1,492,137,428**	**1,494,208,078**
09. වෙනත් මෙහෙයුම්වලින් ලද ආදායම			
මුද්‍රණාලීය අබලි කොල සහ අනෙකුත් ද්‍රව්‍ය	24,375,616	19,686,846	19,686,846
ටෙන්ඩර් තැන්පතු සහ ලියාපදිංචි	1,247,618	554,000	554,000
ආපන ශාලාවෙන් ලද ආදායම	-	250,310	-
	25,623,234	**20,491,155**	**20,240,846**

	2021	2020 නැවත සකස්කළ	2020
	රු.	රු.	රු.
10. විකිණීමේ හා බෙදාහැරීම් වියදම්			
ජාතිය ගොඩනැගීමේ බද්ද	-	2,802,242	2,802,242
ආර්ථික සේවා ගාස්තු	-	9,215,451	9,215,451
මෝටර් රථවාහන නඩත්තුව	1,108,984	2,812,178	2,812,178
දැන්වීම් සඳහා	565,783	261,288	261,288
අලෙවි ප්‍රවර්ධන කටයුතු	439,419	1,095,827	1,095,827
බොල් ණය සඳහා ප්‍රතිපාදන	29,527,127	1,984,063	1,984,063
ගිනි රක්ෂණය - අලෙවිසැල්	-	112,805	112,805
නැවත නොගෙවන ටෙන්ඩර් තැන්පතු	166,345	166,427	166,427
කුලී	3,220,917	2,956,016	2,956,016
වරිපනම්	82,846	39,369	39,369
ජල ගාස්තු - අලෙවිසැල්	27,436	36,207	36,207
විදුලිය - අලෙවිසැල්	92,914	103,168	103,168
දුරකථන - අලෙවිසැල්	98,062	189,969	189,969
නඩත්තු - අලෙවිසැල්	10,825	-	-
	35,340,658	**21,775,010**	**21,775,010**
11. ආයතන හා පරිපාලන වියදම්			
ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු	415,129	505,784	505,784
කාර්යාල උපකරණ නඩත්තුව	762,931	649,239	649,239
ක්ෂයවීම් - කාර්යාලයීය උපකරණ	1,516,681	1,363,012	1,363,012
- පරිගණක උපාංග	1,187,369	233,676	233,676
වැටුප් හා වේතන	118,359,563	123,819,539	123,819,539
අතිකාල දීමනා	13,615,151	9,986,770	9,986,770
සේවක අර්ථසාධක අරමුදල	14,858,655	15,250,427	15,250,427
සේවක භාරකාර අරමුදල	3,714,677	3,740,731	3,740,731
දිරි දීමනා	1,564,510	1,801,250	1,801,250
සභාපති වේතනය	960,000	960,000	960,000
අධ්‍යක්ෂමණ්ඩල ගාස්තු	443,000	356,500	356,500
තැපැල් ගාස්තු	126,431	137,708	137,708
දුරකථන	1,592,973	1,195,010	1,195,010
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	2,383,894	1,760,971	1,760,971
පුවත්පත් දැන්වීම් හා ප්‍රකාශන	1,573,869	883,424	883,424
ප්‍රවාහනය හා යැපුම් දීමනා	565,455	734,678	734,678
පුවත්පත් හා වාර සඟරා	85,570	67,060	67,060
රථවාහන කුලී	-	14,500	14,500
පොදු කාර්යාලයීය වියදම්	202,423	185,542	185,542
විගණන වියදම්	912,000	900,000	900,000
විවිධ වියදම්	197,297	50,751	50,751
නෛතික හා උපදේශන සේවා	1,138,564	533,162	533,162
චින්දනාත්මක කටයුතු	170,978	123,528	123,528
පාරිතෝෂික වියදම්	16,366,766	-	-
සේවක පුහුණු කිරීම්	41,050	137,675	137,675
විගණන හා කළමනාකරණ කමිටු ගාස්තු	132,500	48,500	48,500
අන්තර්ජාල / විද්‍යුත් තැපෑල	492,885	192,252	192,252
ටෙන්ඩර් මණ්ඩල තාක්ෂණික කමිටු වියදම්	1,000,000	1,088,000	1,088,000
25% මෝටර් රථවාහන නඩත්තුව	1,108,984	2,812,178	2,812,178

	2021 රු.	2020 නැවත සකස්කළ රු.	2020 රු.
අධ්‍යක්ෂ මණ්ඩල හමු සඳහා වියදම්	34,530	32,713	32,713
සාමාජික ගාස්තු	13,000	50,000	50,000
පරිත්‍යාග	39,874	7,179	7,179
පරිගණක අලුත්වැඩියා හා නඩත්තු ගාස්තු	300,950	345,300	345,300
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	119,739	163,883	163,883
බාහිර මුද්‍රණ වැඩ	2,875	45,500	45,500
	186,000,274	**170,176,441**	**170,176,441**
12. වෙනත් මෙහෙයුම් වියදම්			
සේවක සුභසාධනය	17,134,550	18,935,987	18,935,987
සේවක වෛද්‍ය පහසුකම්	9,088,015	8,158,170	8,158,170
නිවාස ණය පොලී	1,338,400	1,772,844	1,772,844
කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා	-	-	-
විශේෂ දිරි දීමනා	23,891,565	47,240,316	-
කාර්ය මණ්ඩල ප්‍රවාහනය	8,146,582	6,962,117	6,962,117
නිවාඩු සඳහා ගෙවීම්	23,753,315	-	-
කාර්ය මණ්ඩල සම්මාන	98,000	47,250	47,250
	83,450,427	**83,116,684**	**35,876,369**
13.1 මූල්‍ය ආදායම්			
ආපදා ණය සඳහා පොලී ලැබීම්	452,698	843,374	843,374
බැංකු පොලී ලැබීම්	901,559	1,134,441	1,134,441
ස්ථිර තැන්පතු සඳහා පොලී ලැබීම්	625,000	-	-
	1,979,257	**1,977,815**	**1,977,815**
13.2 මූල්‍ය වියදම්			
බැංකු ගාස්තු හා බැංකු ඇපකර ගාස්තු	1,983,638	1,827,378	1,827,378
බැංකු අයිරා පොලී	4,241,195	4,993,996	4,993,996
බැංකු ණය පොලී - කෙටි කාලීන	84,438,970	100,764,950	100,764,950
බැංකු ණය පොලී - දිගු කාලීන	7,169,709	12,772,308	12,772,308
	97,833,511	**120,358,632**	**120,358,632**
14. ආදායම් බදු			
වර්ෂය සඳහා ආදායම් බදු වෙන් කිරීම - සටහන 14.1	-	-	-
	-	-	-

14.1 ආදායම් බදු ගණනය තක්සේරු වර්ෂය 2021/2022
පදනම - 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන ගිණුම් වර්ෂය

	රු.
වෙළඳ හෝ ව්‍යාපාරවලින් බදු අයකළ හැකි ලාභය	(208,096,656)
පොලී ආදායම	1,979,257
වෙනත් මූලාශ්‍ර වලින් ලාභය	-
ලිපිද්‍රව්‍ය ආදායම	(206,117,399)
අඩුකළා : මුළු ලිපිද්‍රව්‍ය ආදායම් වලින් අඩුකිරීම්	
වෙළඳ ව්‍යාපාර වලින් අඩුකළ හැකි අලාභ	(206,117,399)
පොලී, වාරික, බිම් කුලී සහ කතෘ භාගය ගෙවීම්	-
බදු අයකළහැකි ආදායම	-

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

15. දේපළ, පිරියත සහ උපකරණ

විස්තරය	ප්‍රත්‍යාගණනය 01. 01. 2020	වර්ෂය තුළ එකතුවීම් හා ප්‍රත්‍යාගණනය	වර්ෂය තුළ ඉවත් කිරීම්	ප්‍රත්‍යාගණන/ පිරිවැය 31. 12. 2020	පිරිවැය/ ප්‍රත්‍යාගණනය 01. 01. 2021	2021 වර්ෂය තුළ එකතු කිරීම්	භාණ්ඩාගාර ප්‍රධානයන් යන්තු අත්පත්කර ගැනීම සඳහා	2021 වර්ෂය තුළ ඉවත් කිරීම්	2021. 12. 31 දිනට ශේෂය
පිරිවැයට									
ඉඩම්	378,500,000	-	-	378,500,000	378,500,000	-		107,000,000	271,500,000
ගොඩනැගිලි	166,600,000	-	-	166,600,000	166,600,000	-		-	166,600,000
පිරියත හා යන්ත්‍රෝපකරණ	545,966,426	6,144,748	-	552,111,174	552,111,174	28,866,670	217,382,421	-	798,360,265
මෝටර් හා වෙනත් වාහන	55,563,000	-	-	55,563,000	55,563,000	-		-	55,563,000
කාර්යාලයීය උපකරණ	13,721,199	810,041	-	14,531,240.00	14,531,240	1,705,783		-	16,237,023
පරිගණක හා උපාංග	5,785,210	833,514	-	6,618,724	6,618,724	5,620,011		-	12,238,735
ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන	2,572,951	-	-	2,572,951	2,572,951	-		-	2,572,951
එකතුව	**1,168,708,786**	**7,788,303**	**-**	**1,176,497,089**	**1,176,497,089**	**36,192,464**	**217,382,421**	**107,000,000**	**1,323,071,974**
සමුච්චිත ක්ෂය වීම්									
විස්තරය	**ප්‍රත්‍යාගණනය 01. 01. 2020**	**වර්ෂය තුළ ක්ෂයවීම් 2020**	**වර්ෂය තුළ ඉවත් කිරීම්**	**සමුච්චිත ක්ෂයවීම් 31.12.2020**	**වර්ෂය තුළ ඉවත් කිරීම්**	**පිරිවැය / ප්‍රත්‍යාගණනය 01.01.2021**		**වර්ෂය තුළ ක්ෂයවීම් 2021**	**සමුච්චිත ක්ෂයවීම් 31.12.2021**
ගොඩනැගිලි	12,495,000	4,165,000	-	16,660,000	16,660,000	4,165,000		-	20,825,000
පිරියත හා යන්ත්‍රෝපකරණ	105,284,857	41,154,235	-	146,439,092	146,439,092	49,332,990		-	195,772,082
මෝටර් රථ හා මෝටර් සයිකල්	48,619,625	6,943,351	-	55,562,976	55,562,976	-		-	55,562,976
කාර්යාලයීය උපකරණ හා ලී බඩු	3,045,622	1,363,012	-	4,408,634	4,408,634	1,516,681		-	5,925,315
පරිගණක හා උපාංග	5,565,512	233,676	-	5,799,188	5,799,188	1,186,537		-	6,985,725
ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන	2,572,950	-	-	2,572,950	2,572,950	-		-	2,572,950
එකතුව	**177,583,565**	**53,859,274**	**-**	**231,442,839**	**231,442,839**	**56,201,209**	**-**	**-**	**287,644,047**
ලියා හල අගය				**945,054,250**					**1,035,427,927**

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයට අදාළ සටහන්

	2021 රු.	2020 නැවත සකස්කළ රු.	2020 රු.
16. තොගය			
අමුද්‍රව්‍ය	92,745,990	134,155,985	134,155,985
පාරිභෝගික භාණ්ඩ	8,423,058	7,987,214	7,987,214
අමතර කොටස්	39,956,646	44,165,115	44,165,115
ලෝහ භාණ්ඩ / ගොඩනැගිලි ද්‍රව්‍ය	1,288,618	1,188,782	1,188,782
නිමි තොගය	115,057,362	74,834,655	74,834,655
නොනිමි තොගය	70,399,790	45,845,249	43,774,599
මාර්ගස්ථ තොග (අමතර කොටස්)	-	-	-
	327,871,465	**308,177,000**	**306,106,350**
17. වෙළඳ ලැබිය යුතු ශේෂය			
වෙළඳ ණයගැතියෝ	752,068,839	631,884,703	653,613,934
අඩමාණ ණය සඳහා වෙන් කිරීම්	(64,560,453)	(35,033,326)	(35,033,326)
අ.ප්‍ර.දෙ. තත්ත්ව හානි/දඩ වෙන්කිරීම්	(9,343,150)	(5,762,226)	(5,762,226)
වෙනත් ණයගැතියෝ	361,309	361,309	361,309
	678,526,544	**591,450,459**	**613,179,690**
18. වෙනත් ලැබිය යුතු ශේෂය			
සේවක ණය හා අත්තිකාරම් (සටහන 18.1)	5,016,011	6,093,339	6,093,339
තැන්පතු හා ලැබීම් (සටහන 18.2)	7,504,586	9,761,392	9,761,392
විකුණුම් පාලන ගිණුම (සටහන 18.3)	(2,527,255)	(1,561,836)	(1,561,836)
බැංකු ණය - තීරු/ආන්තික ගිණුම - මහජන බැංකුව ජාත්‍යන්තර	14,533,440	14,533,440	14,533,440
අයකරවා ගතහැකි බදු (ඉ/ගෙ. යෙදවුම් වැට් බදු)	625,000	-	-
	25,151,782	**28,826,335**	**28,826,335**
18.1 ණය හා අත්තිකාරම්			
ආපදා ණය	1,998,612	3,128,277	3,128,277
උත්සව අත්තිකාරම්	1,886,000	2,072,000	2,072,000
සේවක වැටුප් අත්තිකාරම්	56,000	5,000	5,000
ණය හිමි අත්තිකාරම් ගිණුම	1,075,399	888,062	888,062
	1,075,399	**888,062**	**888,062**
18.2 තැන්පතු හා ලැබීම්			
තැන්පතු සඳහා ලැබීම්	6,939,202	9,316,005	9,316,005
අමතර වෙනත් ලැබීම්	565,383	445,387	445,387
	7,504,586	**9,761,392**	**9,761,392**
18.3 විකුණුම් පාලන ගිණුම			
විකුණුම් පාලන ගිණුම	(2,527,255)	(1,561,836)	(1,561,836)
	(2,527,255)	**(1,561,836)**	**(1,561,836)**
19. මුදල් හා මුදල්වලට සමාන දෑ			
බැංකුවේ ඇති මුදල්	32,362,664	35,501,418	35,501,418
මාර්ගස්ථ මුදල්	2,615,326	603,662	603,662
අතැති මුදල්	27,000	30,000	30,000
	35,004,991	**36,135,080**	**36,135,080**
මුදල් ගලා ඒම, මුදල් සහ මුදල් හා සමාන ප්‍රකාශනය සඳහා වන තොරතුරු පහත පරිදි වේ.			
බැංකුවේ ඇති මුදල් - මහජන බැංකුව, නුගේගොඩ	1,968,945	-	-
- මහජන බැංකුව, නුගේගොඩ	28,197,025	30,076,446	30,076,446
- ලංකා බැංකුව, හෝමාගම	2,171,694	5,399,972	5,399,972
- ලංකා බැංකුව, හෝමාගම	25,000	25,000	25,000
මාර්ගස්ථ මුදල්	2,615,326	603,662	603,662
අතැති මුදල්	27,000	30,000	30,000
	35,004,991	**36,135,080**	**36,135,080**
බැංකු අයිරා - මහජන බැංකුව, කොළඹ	(36,975,695)	(40,284,056)	(40,284,056)
- මහජන බැංකුව, නුගේගොඩ	-	(3,627,776)	(3,627,776)
	(1,970,704)	**(7,776,752)**	**(7,776,752)**

	2021 රු.	2020 නැවත සකස්කළ රු.	2020 රු.
20. බැංකු ණය - දිගු කාලීන			
2021. 01. 01 දිනට ආරම්භක ශේෂය	92,917,055	136,642,139	136,642,139
වර්ෂය තුළ ණය සඳහා ගෙවීම්	(37,419,855)	(43,725,084)	(43,725,084)
වර්ෂය අවසානයට ශේෂය	**55,497,200**	**92,917,055**	**92,917,055**
21. විලම්බිත බදු බැරකම්			
වර්ෂය ආරම්භක දිනට		(17,105,398)	(17,105,398)
වර්ෂය තුළදී ගැලපීම්/වෙනස් වීම්	-	-	-
		17,105,398	17,105,398
වර්ෂය අවසාන දිනට	-	-	-

* ඉදිරි වර්ෂයේ බදු පසු ලාභය ගණනය කිරීමට අවශ්‍ය නොවන නිසා විලම්හිත බදු සඳහා වෙන් කිරීම් සිදු කර නොමැත

22. වෙළඳ ගෙවිය යුතු ශේෂයන්			
වෙළඳ ණය හිමියන්	463,229,261	117,459,149	117,459,149
වෙනත් ණය හිමියන් (Royalty, Consign & Other)	1,696,699	1,690,775	1,690,775
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (22.1)	200,195,314	207,799,230	207,799,230
විකුණුම් අත්තිකාරම්	17,584	17,584	17,584
වෙනත් ණය හිමියන් (හර ශේෂය)	1,279,659	1,279,658	1,279,658
	666,418,516	**328,246,396**	**328,246,396**
22.1 ගෙවිය යුතු - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව			
ආර්ථික සේවා ගාස්තු	23,342,409	23,342,409	23,342,409
එකතු කළ අගය මත බදු	90,727,416	98,331,332	98,331,332
ජාතික ආරක්ෂක බදු	80,840,239	80,840,239	80,840,239
ආදායම් බදු	5,000,000	5,000,000	5,000,000
රඳවා ගැනීමේ බදු	158,950	158,950	158,950
රඳවා ගැනීමේ බදු - ගෙවිය යුතු	126,300	126,300	126,300
	200,195,314	**207,799,230**	**207,799,230**
23. වෙනත් ගෙවිය යුතු ශේෂයන්			
උපචිත වියදම්	77,088,193	83,713,115	36,472,800
තැන්පතු ගෙවීම්	2,212,962	1,884,462	1,884,462
සේවකයන් සඳහා ලබාදෙන පොත් සඳහා වෙන් කිරීම්	-	1,447,150	1,447,150
	79,301,155	**87,044,727**	**39,804,411**
24. කෙටි කාලීන බැංකු ණය			
2021.01.01 දිනට ආරම්භක ශේෂය	985,463,449	840,717,598	840,717,598
ලබා ගත් ණය මුදල	1,284,578,247	1,502,920,429	1,502,920,429
ණය ගෙවීම් - වර්ෂය තුළ ගෙවීම්	(1,245,940,266)	(1,358,174,578)	(1,358,174,578)
2021.12.31 දිනට අවසාන ශේෂය	**1,024,101,430**	**985,463,449**	**985,463,449**

25. යන්ත්‍ර සඳහා භාණ්ඩාගාර ප්‍රදාන	**2021** රු.
ආරම්භක ශේෂය	-
වර්ෂය තුළ භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම්	217,382,421
වර්ෂය තුළ ක්ෂය කිරීම්/ක්ෂය කිරීම්	(7,088,008)
අවසන් ශේෂය	**210,294,414**

කාරක ගිණුම (ප්‍රධාන මුද්‍රණාලය) 2021. 01. 01. සිට 2021. 12. 31 දක්වා කාලසීමාව තුළ

		නැවත සකස්කල	
	2021.12.31 දක්වා රු.	2020.12.31 දක්වා රු.	2020.12.31 දක්වා රු.
මුද්‍රණ ආදායම			
පෙළපොත්	1,186,918,385	1,369,812,655	1,369,812,655
ලොතරැයි මුද්‍රණය (ජා.ලොම.)	247,229,602	266,593,026	266,593,026
ජොබ් වැඩ (වාණිජ මුද්‍රණ කටයුතු)	53,795,367	43,832,169	65,561,401
(1) **මුළු ආදායම්**	**1,487,943,354**	**1,680,237,850**	**1,701,967,082**
ආදායම් අඩු කළ ගාස්තු			
ප්‍රමාද ගෙවීම්/තත්වහානි හා දඩ (අ.ප්‍ර.දෙ.)	410,261	29,789,127	29,789,127
අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු/තත්වහානි සඳහා වෙන්කිරීම්	9,343,150	5,762,226	5,762,226
ප්‍රමාද ගෙවීම් (ජා.ලොම.)	3,177,350	11,205,760	11,205,760
(1.1) මුළු ආදායමෙන් අඩු කළ ගාස්තු	**12,930,761**	**46,757,113**	**46,757,113**
කර්මාන්තශාලා වියදම් (සෘජු)			
අමු ද්‍රව්‍ය පරිභෝජනය	896,611,944	764,884,230	764,884,230
පාරිභෝගික ද්‍රව්‍ය පරිභෝජනය	16,397,134	13,938,266	13,938,266
අමතර කොටස් පරිභෝජනය	18,156,203	22,789,300	22,789,300
ලෝහ භාණ්ඩ පරිභෝජනය	3,583,469	3,647,747	3,647,747
(2) මුළු පරිභෝජනය	**934,748,750**	**805,259,543**	**805,259,543**
ශ්‍රමය - සෘජු			
වැටුප් හා වේතන	136,686,216	136,348,132	136,348,132
අතිකාල දීමනා	26,422,438	22,924,576	22,924,576
කැලි ගණනට වැඩ කිරීම්	41,393,869	37,362,743	37,362,743
සේවක අර්ථසාධක අරමුදල	17,491,529	17,600,448	17,600,448
සේවක භාරකාර අරමුදල	4,372,884	4,235,417	4,235,417
දිරි දීමනා	2,067,750	2,155,000	2,155,000
(3) මුළු සෘජු ශ්‍රමය	**228,434,686**	**220,626,316**	**220,626,316**
(4) විදුලිය	11,805,644	11,025,934	11,025,934
(5) මුළු සෘජු පිරිවැය [2 + 3 + 4]	**1,174,989,080**	**1,036,911,793**	**1,036,911,793**
කර්මාන්තශාලා වියදම් (වක්‍ර)			
වැටුප් හා වේතන	26,962,760	28,718,602	28,718,602
අතිකාල දීමනා	2,517,259	9,835,526	9,835,526
සේවක අර්ථසාධක අරමුදල	3,381,118	3,679,978	3,679,978
සේවක භාරකාර අරමුදල	845,267	1,156,568	1,156,568
දිරි දීමනා	405,000	420,000	420,000
යන්ත්‍රෝපකරණ හා නඩත්තු	11,912,768	8,778,632	8,778,632
බාහිර මුද්‍රණ වැඩ (ජා.ලොම.)	2,729,738	53,371,052	53,371,052

බාකෝඩින් යන්ත්‍ර නඩත්තු කිරීම	13,748,685	9,324,550	9,324,550
විදුලිය	1,311,738	1,225,104	1,225,104
ගිනි රක්ෂණය	747,839	631,264	631,264
සාම්පල හා කඩදාසි පරීක්ෂා කිරීමේ ගාස්තු	209,845	40,177	40,177
යන්ත්‍ර කුලියට ගැනීමේ වියදම්	579,337	505,840	505,840
සේවක නිල ඇඳුම්	-	320,919	320,919
රථ වාහන නඩත්තු			
අලුත්වැඩියාවන්	2,340,621	1,384,247	1,384,247
ඉන්ධන සහ තෙල්	1,544,775	2,221,598	2,221,598
රක්ෂණය	550,539	699,514	699,514
ක්ෂය කිරීම	-	6,943,351	6,943,351
අඩු කළා :-			
25% ක් ලාභාලාභ ගිණුමේ පරිපාලන වියදම්	(1,108,984)	(2,812,178)	(2,812,178)
25% ක් විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	(1,108,984)	(2,812,178)	(2,812,178)
25% ක් ලිපිද්‍රව්‍ය කම්හලේ කාරක ගිණුම සඳහා	(1,108,984)	(2,812,178)	(2,812,178)
ක්ෂය කිරීම			
ගොඩනැගිලි	3,757,500	3,757,500	3,757,500
යන්ත්‍රෝපකරණ	42,807,803	34,629,048	34,629,048
(6) මුළු වක්‍ර පිරිවැය	123,025,642	159,206,936	159,206,936
(7) නිෂ්පාදන පිරිවැය [5 + 6]	1,298,014,723	1,196,118,729	1,196,118,729
එකතු කළා : ආරම්භක තොගය නොනිමි වැඩ තොගය	17,180,015	47,654,896	47,654,896
ආරම්භක තොගය නිමි භාණ්ඩ තොගය	2,553	27,520,231	27,520,231
අඩු කළා : අවසාන තොගය නොනිමි වැඩ තොගය	(50,271,369)	(17,180,015)	(15,109,365)
අවසාන තොගය නිමි භාණ්ඩ තොගය	(2,796,150)	(2,553)	(2,553)
අඩු කළා: පරිගණක ලිපිද්‍රව්‍ය අංශයට හුවමාරු කළ අගය	(980,335)	(1,760,971)	(1,760,971)
ප්‍රකාශන අංශයට හුවමාරු කළ අගය	-	(253,960)	(253,960)
අබලි තොග	-	42,295	42,295
ඉඩදිය නොහැකි යෙදවුම් බද්ද	58,075,736	57,568,922	57,568,922
(8) වෙනත් වියදම්/තොග ගැලපීම්	**21,210,449**	**113,588,845**	**115,659,495**
(9) මුළු නිෂ්පාද පිරිවැය	**1,332,155,933**	**1,356,464,687**	**1,358,535,338**
(10) දළ කාරක ලාභය [1 - 8]	**155,787,421**	**323,773,163**	**343,431,744**

කාරක ගිණුම (ලිපිද්‍රව්‍ය කර්මාන්ත ශාලාව) 2021. 01. 01. සිට 2021. 12. 31 දක්වා කාලසීමාව තුළ

	2021.12.31 දක්වා රු.	නැවත සකස්කල 2020.12.31 දක්වා රු.	2020.12.31 දක්වා රු.
(1) ලිපිද්‍රව්‍ය විකිණීමෙන් ආදායම	**126,407,838**	**122,003,076**	**122,003,076**
කර්මාන්ත ශාලා වියදම් - සෘජු			
මුළු අමුද්‍රව්‍ය පරිභෝජනය	108,197,125	109,757,992	109,757,992
පාරිභෝගික ද්‍රව්‍ය පරිභෝජනය	808,442	620,802	620,802
අමතර කොටස් පරිභෝජනය	1,147,324	1,254,586	1,254,586
(2) මුළු පරිභෝජනය	**110,152,891**	**111,633,380**	**111,633,380**
ශ්‍රමය - සෘජු :			
සේවක වැටුප් හා වේතන	22,763,052	24,096,879	24,096,879
අතිකාල දීමනා	6,522,869	4,645,854	4,645,854
කෑලි ගණනට වැඩ කිරීම්	0	536,253	536,253
සේවක අර්ථසාධක අරමුදල	3,003,571	3,131,534	3,131,534
සේවක භාරකාර අරමුදල	750,893	782,884	782,884
දිරි දීමනා	338,250	368,750	368,750
(3) මුළු සෘජු ශ්‍රමය	**33,378,635**	**33,562,154**	**33,562,154**
මුළු සෘජු පිරිවැය			
(4) විදුලිය	**1,124,810**	**1,136,922**	**1,136,922**
(5) මුළු සෘජු පිරිවැය [2 + 3 + 4]	**144,656,336**	**146,332,456**	**146,332,456**
කර්මාන්ත ශාලා වියදම් - සෘජු			
වැටුප් හා වේතන	4,657,275	6,179,839	6,179,839
අතිකාල දීමනා	663,553	514,437	514,437
සේවක අර්ථසාධක අරමුදල	620,964	1,068,358	1,068,358
සේවක භාරකාර අරමුදල	155,241	267,089	267,089
දිරි දීමනා	57,750	70,250	70,250
යන්ත්‍රෝපකරණ හා නඩත්තු		332,000	332,000
විදුලිය	124,979	126,325	126,325
ක්ෂය කිරීම			
ගොඩනැගිලි	407,500	407,500	407,500
යන්ත්‍රෝපකරණ	6,525,188	6,525,188	6,525,188
(6) කර්මාන්ත ශාලා වියදම් වක්‍ර	**13,212,450**	**15,490,986**	**15,490,986**
(7) නිෂ්පාදන පිරිවැය [5 + 6]	**157,868,785**	**161,823,441**	**161,823,441**
එකතු කළා : ආරම්භක තොගය නොනිමි වැඩ	28,665,234	9,074,168	9,074,168
නිමි භාණ්ඩ	60,751,160	33,501,798	33,501,798
අඩු කළා : අවසාන තොගය නොනිමි වැඩ	(20,128,421)	(28,665,234)	(28,665,234)
නිමි භාණ්ඩ	(102,785,342)	(60,751,160)	(60,751,160)
අඩු කළා ; පරි. මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය ගිණුමට මාරු කළා	(1,150,295)	-	-
ලිපිද්‍රව්‍ය මාරුකළා සේවක සුභසාධන, පරිත්‍යාග හා වෙනත්	(1,473,778)	-	-
මෝටර් රථ වටිනාකම ප්‍රධාන මුද්‍රණාල කාරක ගිණුමෙන් මාරුකළා 25%	1,108,984	2,812,178	2,812,178
තොග ඌනතා	(14,341)	(39,725)	(39,725)
තොග අතිරික්තතා	-	71,747	71,747
(8) වෙනත් වියදම්/තොග ගැලපීම්	**(35,026,800)**	**(43,996,230)**	**(43,996,230)**
(9) එකතුව නිෂ්පාදන පිරිවැය	**122,841,986**	**117,827,212**	**117,827,212**
(10) දළ කාරක ලාභය [1 - 8]	**3,565,852**	**4,175,864**	**4,175,864**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

ආදායම් සහ වියදම් ගිණුම (ප්‍රකාශන අංශය) 2021. 01. 01. සිට 2021. 12. 31 දක්වා කාලසීමාව තුළ

	2021.12.31 දක්වා රු.	නැවත සකස්කල 2020.12.31 දක්වා රු.	2020.12.31 දක්වා රු.
ආදායම්	**640,689**	**410,186**	**410,186**
අඩු කළා : නිෂ්පාදන පිරිවැය :			
ආරම්භක තොගය	3,476,962	4,002,452	4,002,452
එකතු කළා : නිෂ්පාදන පිරිවැය ප්‍රධාන මුද්‍රණාල කාරක ගිණුමෙන් මාරුකළා	-	253,960	253,960
එකතු කළා : තොග ඌනතා	(923)	(8,385)	(8,385)
තොග අතිරික්තතා	-	1,707	1,707
අඩු කළා : අවසාන තොගය	(3,114,875)	(3,476,962)	(3,476,962)
නිෂ්පාදන පිරිවැය	**361,164**	**772,772**	**772,772**
මාරු කළා, සේවක සුභසාධන, පරිත්‍යාග සහ වෙනත්	(714,191)	(8,331)	(8,331)
එකතු කළා : වියදම්			
වැටුප් හා වේතන	1,800,845	1,691,877	1,691,877
අතිකාල දීමනා	16,539	104,583	104,583
සේවක අර්ථසාධක අරමුදල	226,287	218,798	218,798
සේවක භාරකාර අරමුදල	56,572	54,699	54,699
දිරි දීමනා	23,250	24,000	24,000
නියෝජනය මත විකුණුම් සඳහා ගෙවීම්	951	47,927	47,927
කතීෘ භාග	56,276	35,708	35,708
ප්‍රකාශන පරිත්‍යාග	714,191		
අමතර වියදම්	-	65,500	65,500
මුළු නිෂ්පාදන වියදම්	2,541,885	3,007,535	3,007,535
ආදායමට වැඩි වියදම් අතිරික්තය	**(1,901,196)**	**(2,597,349)**	**(2,597,349)**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

වෙළඳ ගිණුම (වෙනත් අලෙවි අංශ) 2021. 01. 01. සිට 2021. 12. 31 දක්වා කාලසීමාව තුළ

	2021.12.31 දක්වා රු.	Restated 2020.12.31 දක්වා රු.	2020.12.31 දක්වා රු.
ආදායම්	**18,355,631**	**18,709,825**	**18,709,825**
අඩු කළා : විකුණුම් පිරිවැය			
ආරම්භක තොගය	10,603,979	7,737,536	7,737,536
මිලදී ගැනීම්	11,919,850	17,707,765	17,707,765
එකතු කළා : තොග ඌනතා	(192,842)	(10,218)	(10,218)
අතිරික්තතා	6,891	6,891	
අඩු කළා : අවසාන තොගය	(6,360,996)	(10,603,979)	(10,603,979)
විකුණුම් පිරිවැය	**15,969,992**	**14,837,994**	**14,837,994**
දළ ලාභය	**2,385,639**	**3,871,831**	**3,871,831**

2021 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඑම්/ඩී/එස්පීසී/01/21/214 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 දෙසැම්බර් 30 දින

සභාපති

රාජ්‍ය මුද්‍රණ සංස්ථාව

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්වාගණනය කළ මතය

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. නත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 69 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ දිගු කාලීන ණය ශේෂය වූ රු. 55,497,200 න් වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසානයේ සිට මාස 12 කට වැඩි නොවන කාලපරිච්ඡේදයකදී ගෙවිය යුතු මුදල සහ මාස 12 කට වැඩි කාලපරිච්ඡේදයකදී ගෙවිය යුතු මුදල හෙළිදරව් කළ යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 49 ඡේදය ප්‍රකාරව පෙර වර්ෂ වැරදි වල ස්වභාවය සහ මුල්‍ය ප්‍රකාශනහි ඇති බලපෑමට ලක්වී ඇති රේඛිය අයිතම හි නිවැරදි කරන ලද මුල්‍ය වටිනාකම පිළිබඳ විස්තර මුල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කල යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. පෙර වර්ෂයේ ගැලපීම් හේතුවෙන් ඉකුත් වර්ෂයේ ගිණුම්වල වූ රු. 22,914,300 ක් වූ අතිරික්තය රු. 43,734,288 ක ඌණතාවයක්ව තිබූ අතර ඒ පිලිබඳව ගිණුම්වල හෙලිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 16 (b) ඡේදය ප්‍රකාරව වත්කම් පරිහරණය කළ හැකි තත්ත්වයට හා ස්ථානයට පත් කිරීමට වැය වන පිරිවැය අදාළ දේපළ පිරියත හා උපකරණ හි පිරිවැය ලෙස හඳුනාගත යුතු වුවද යන්ත්‍රය ස්ථාපිත කරන කර්මාන්ත ශාලාවේ ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද රඳවාගත් මුදල වන රු. 703,095 , කාර්යය සාධන සුරක්ෂණයේ වටිනාකම වන රු.650,000 සහ එකතු කළ අගය මත බදු මුදල වන රු. 12,670 ඇතුළත් එකතු වටිනාකම වූ රු.1,365,765 ගිණුම්ගත නොකිරීම නිසා දේපළ පිරියත හා උපකරණ ඒ ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. ඒ තුළින් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම ද රු.65,434 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන ඡේදය ප්‍රකාරව වත්කමක සුන්බුන් අගය (Residual Value) සහ එහි ඵලදායී ජීවිත කාලය අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂයක් අවසානයේදී සමාලෝචනය කළ යුතු අතර , අපේක්ෂා කළ අගයන් හැර ඇස්තමේන්තු අගයන්ගෙන් වෙනස් වේ නම් එම වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්කමක් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ගිණුම්ගත කළ යුතු වුවද , මුළුමනින්ම ක්ෂය කර ඇති එහෙත් තවදුරටත් භාවිතා කරන එකතුව රු. 63,871,121 ක් වටිනා දේපළ පිරියත උපකරණ අයිතම 317 ක ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍ර දිනට මුද්‍රණ වැඩ අවසන් කර නොතිබුණු එකතු කළ අගය මත බදු සහිතව එකතු වටිනාකම රු.1,763,758 ක් වූ මුද්‍රණ ඇනවුම් 7 ක්, විකුණුම් ලෙස දක්වා තිබුණු අතර ඉන්වොයිසි 4 ක් යටතේ විවිධ ආයතනවලට සමාලෝචිත වර්ෂයේ ලබා දී තිබූ රු. 9,447,404 ක් වූ මුද්‍රිත ද්‍රව්‍ය, විකුණුම් ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) මුද්‍රණ වැඩ නිමකර ජාතික ලොතරැයි මණ්ඩලයට භාර දී තිබූ, මුද්‍රණ ඇනවුම් 26 ක් ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ලොතරැයි මුද්‍රණ ආදායම රු.13,259,240 කින් , එකතු කළ අගය මත බදු බැරකම රු. 1,060,739 කින් සහ ප්‍රමාද ගාස්තු වියදම රු. 570,440 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා දී තිබූ ඉඩමට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තය වූ රු. 106,864,633 එම ගිණුමෙන් ඉවත් කර ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඌ) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට මුද්‍රණය කර භාර දී තිබූ එකතු වටිනාකම රු.2,796,150 ක් වූ පාසල් පෙළ පොත් 52,500 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් තොග ලෙස දක්වා තිබුණි.

(එ) මුද්‍රණ සංස්ථාවේ ලෙජරයේ කේවල ගිණුම් ශේෂ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් ආයතන 17 කින් සහ ආයතන 10 කින් අයවිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් රු. 10,087,595 ක් සහ රු. 44,865,636 ක් වුවද එම ආයතන විසින් විගණනය වෙත තහවුරු කරන ලද ශේෂයන් රු. 1,512,445 ක් සහ රු. 70,033,215 ක් විය.

1.3. කරුණු අවධාරණය කිරීම

මූල්‍ය ප්‍රකාශන වල අංක 2.3 කෙරෙහි අවධානය යොමු කරවන අතර එහි දක්වා ඇති පරිදි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම ඇතැයි යන්න නිශ්චය කිරීම මත සකස් කර ඇත. එසේ වුව ද, ආයතනයේ මුළු වගකීම් රු 108,657,608 කින් මුළු වත්කම් ඉක්මවා ඇති අතර ජංගම වගකීම්, ජංගම වත්කම් ද ඉක්මවා ඇති බව නිරීක්ෂණය කරමි. එසේ වුව ද 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනතේ 18(3) වගන්තිය අනුව ආයතනයේ අඛණ්ඩ පැවැත්ම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට මුදල් අමාත්‍යාංශයේ සහාය ලබා දීමට බැඳී ඇති බවට ප්‍රතිපාදන සලසා ඇති බව නිරීක්ෂණය කරමි. මේ කරුණ හේතුවෙන් මාගේ මතය තත්වාගණනය කරනු නොලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මුද්‍රණ සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් සංස්ථාව අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයන්ට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ , පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) ණයවර ලිපිවලින් රු. 448,299,364 කට කඩදාසි ආනයනය කර මිලදි ගැනිමට හැකියාව තිබියදී එසේ සිදුනොකර අවස්ථා 6 කදී දේශීය සැපයුම්කරුවන්ගෙන් රු. 510,249,355 කට කඩදාසි මිලදී ගැනිම හේතුවෙන් සංස්ථාවට රු. 61,949,991 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සංස්ථාවේ සභාපතිවරයා විසින් මුද්‍රණය කරනු ලබන එක් ලොතරැයි පතකින් සංස්ථාවට ලැබීමට නියමිත මුදල ශත 49 සිට ශත 44 දක්වා අඩු කිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට රු. 10,519,265 ක ආදායමක් අහිමි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2021

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මෙම යන්ත්‍රය මිලට ගත් වර්ෂයේ සිටම දිගු කාලීන ණය ශේෂයක් ලෙස ගිණුම් ප්‍රකාශණ වල දක්වා ඇත. මීලඟ වර්ෂයේ (2022) සිට මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී එය නිවැරදිව වෙන්කොට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමට කටයුතු කරන්නෙමු.

(ආ) 2021 වර්ෂයේ ගිණුම් තුළ 2020 වර්ෂයේ නැවත සකස් කළ ගිණුම ඉදිරිපත් කර ඇත. ගිණුම්කරණ ප්‍රමිත වලට අනුගත වීමට උපදෙස් ලබා දී ඇත.

(ඇ) සුරක්ෂා අංශයට මිලදී ගත් සුරක්ෂා මුද්‍රණ යන්ත්‍රය මිලට ගැනීම සඳහා දැරූ පිරිවැය, ගොඩබෑමේ ගාස්තු, වරාය ගාස්තු, ගොඩනැගිලි සැකසීමේ ගාස්තු ඇතුළු සියළුම වියදම් ශ්‍රී.ලං.ගි. ප්‍රමිත 16 ප්‍රකාරව ගිණුම්ගත කර ඇත. එම යන්ත්‍රය සවිකළ සුරක්ෂා අංශයේ අභ්‍යන්තර නඩත්තුව යම් වියදමක් දරා ඇති අතර එයද මෙම යන්ත්‍රයේ පිරිවැයක් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර ඇතත් එම ගෙවීම සිදු කිරීමේදී අඩු කරන ලද රඳවා ගත් මුදල් රු. 703,095.00 ක් සහ කාර්ය සාධන සුරක්ෂණ වටිනාකම රු. 650,000ක් අදාල පිරිවැයෙන් අඩු කොට මුදල් ගෙවා ඇත. අදාල කාර්යයෙහි ප්‍රගතිය සලකා බලා අවසන් ගෙවීම සිදු කිරීමෙන් පසු 2022 ගිණුම් වල නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 වන ඡේදය ප්‍රකාරව එසේ සමාලෝචනය කල යුතු වුවද ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ඇති අයෙකු මගින් සිදු කර ගත යුතු වන අතර, සංස්ථාව වත්කම් ප්‍රත්‍යාගණනයක් ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරගනු ලබයි. එහෙත් ඒ සඳහා සැළකිය යුතු මට්ටමේ වටිනාකමක් ගෙවීම් වශයෙන් කළ යුතුය. සංස්ථාවේ වර්තමාන මූල්‍ය අර්බුදය හමුවේ ඒ සඳහා මුදල් වෙන් කිරීමක් සිදු කිරීමට අපහසු වන මුත් 2023 වසරේදී වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කොට එහි ඵලදායී ජීවිත කාලයද ගණනය කොට නිසි ලෙස ගිණුම්වල පෙන්වීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

(ඉ) භාණ්ඩ ඉල්ලුම්කරු විසින් ඇණවුම් වලට අදාල මුළු භාණ්ඩ ප්‍රමාණයම ලැබෙනතුරු කිසිදු ගෙවීමක් සිදු නොකරයි. එහෙයින් භාණ්ඩ කොටසක් අදාල ආයතනයට යොමු කර ඇතත් එය ආදායමක් සේ සැලකීමට නොහැකි වී ඇත. නමුත් සම්පූර්ණ භාණ්ඩ තොගය යවා අවසන් වූ විගසම ඉන්වොයිස් කර අදාල ආදායම ගිණුම් ගත කරනු ලබයි. මෙම වටිනාකම් 2022 වර්ෂයේදී ආදායමක් ලෙස ගිණුම් ගත කර ඇත

(ඊ) පිළිගනිමි. කොවිඩ් රෝග තත්වය හා ආයතනයේ ඇතිවූ සේවක අර්බුද හේතුවෙන් මෙම තත්වය උද්ගතවී ඇත. ඉදිරියේදී මෙවැනි ප්‍රමාද වී ඉන්වොයිස් කිරීම් වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(උ) මෙම ඉඩම පවරා දීමට අදාල ඉඩමේ ප්‍රත්‍යාගණන අගයද එම ඉඩම පවරා දීමෙන් සිදුවූ අලාභයද නිවැරදිව ගිණුම්වල දක්වා තිබූ බැවින් සංස්ථා ලාභය අඩු වැඩි වීමට බලපෑමක් සිදුව නොමැත. එහෙත් එය ප්‍රත්‍යාගණන ලාභ සංචිතයෙන් ඉවත් කිරීම අතපසුවීමකින් සිදු කිරීමට නොහැකි වීඇති අතර එය ඉදිරි වර්ෂයේදී නිවැරදි හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශණයේ දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ඌ) වැඩපත් අංක 20210464 යටතේ මුද්‍රණය කර අවසන්ව පැවති පිටපත් 52,500 ක ප්‍රමාණයෙහි පිරිවැය නිවැරදිව ප්‍රධාන මුද්‍රණාලයේ නිමි තොග පිරිවැයට එකතු කොට දක්වා ඇත. මෙහි වටිනාකම පිරිවැය අංශයේ වාර්තාවේ ඇති නොනිමි තොග වටිනාකමින් ඉවත් කොට ඇති බැවින් ද්විගණනයක්ද සිදුව නොමැත. එබැවින් නිමිභාණ්ඩ තොගයේ වටිනාකමෙහි හෝ ලාභයෙහි වැඩිවීමක් සිදුව නොමැත.

(ඒ) සංස්ථා ගිණුම් වාර්තා වලට අනුව අයවිය යුතු සහ ගෙවිය යුතු ණය ශේෂයන් නිවැරදිව ගිණුම් ගතකොට ඇත.

03) වෙනත් විගණන නිරීක්ෂණ

අ) මේ සම්බන්ධව 2021 අප්‍රේල් මස සභාපතිතුමාගේ උපදෙස් පරිදි සිදුවී ඇති අවිධිමත් ගණුදෙණු සම්බන්ධව අභ්‍යන්තර විගණන අංශයේ මූලිකත්වයෙන් අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ පැමිණිල්ලක් සිදු කිරීමට කළමණාකාරීත්වය කටයුතු කර ඇත.

ආ) ලොතරැයිපතක් සඳහා ඉන්වොයිස් කරන ලද මුදල අඩු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ ලිපිය අනුව සිදුව ඇති පාඩුව නැවත ලබා දෙන ලෙස ජාතික ලොතරැයි මණ්ඩලයට ඉල්ලීම් කළද ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත.

ANNUAL REPORT

2021 ANNUAL REPORT

Printed at the State Printing Corporation